කස්තිරමු

ඩී බී කුණප්පු

එක්තරා අවදියක ශ්‍රී ලාංකික ජනයාගේ කටට හා කණට පුරුදුව තිබුණු නම් දෙකකි, දැවමොට්ටාවේ සහ මීටියාගොඩ. දෙකම හොරගොල්ල තරමටම දහන් තුඩ තුඩ රැව් දුන් බවත් කිව යුතු ය. කොහොමටත් එදා මැදමුලනට නොලැබුණු අවධානයක් හා වැදගැම්මක් මේ දෙකම ලැබුවේ ය.

ශ්‍රීලනිපය හා එහි නායිකා සිරිමාවෝ බණ්ඩාරනායකට දිගට හරහට පහර දෙමින් පෙරමුණ ගත් දැවමොට්ටාවේ අමරවංශ සහ මීටියාගොඩ ගුණරතන නම් හික්ෂූන් වහන්සේ දෙනම ඒජාපය බලයට ගෙන ඒමේ පුරෝහාමීන් වූවා යි කිවාට වරදක් නැත.

මට මේ අත.නය සිහිපත් වූයේ ඊයේ පෙරේදා රනිල් වික්‍රමසිංහ විසින් මීටියගොඩ හාමුදුරුවන්ගේ බලතල ඉවත් කරන ලද පුවත කියවූ විට ය. මොක්ක්දෝ ජාතික පෙරමුණක නායකත්වයෙන් පහකොට කොන් කර දැමීමය එතැන සිදුවී ඇත්තේ.

ඒ පුවත ඔස්සේ මම හරි හැටි නොදැන සිටි කරුණු දෙකක්ද අල්ලා ගතිමි. එකක් දැවමොට්ටාවේ හාමුදුරුවන් වාගේ දිවංගත නොවී මීටියාගොඩ හාමුදුරුවන් යහතින් වැඩ සිටින බව ය. දෙක තවමත් පරණ පුරුදු දේශපාලන මුවාත තියෙන විත්තියයි.

එහෙම වුණාට එදා රජුන් තැනු හික්ෂුව අද රජ කුමරුන් අතින් හැල්ලුවට පත්වන තැනට වැටී සිටීම නම් කණගාටුවට කරුණකි. වාදිහසිංහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හාමුදුරුවන්ගේ වාදාභිමුඛ රංගනය නිසා දැවමොට්ටාවේ හාමුදුරුවෝත් කැමරාවක් නිසා මීටියාගොඩ හාමුදුරුවෝත් පත්තරකාරයන්ගේ අවධානයට ලක්ව සිටිය හ.

නමසිය හතළිස් ගණන්වල සැතපුම් දහය දොළහ පයින් ගමන්කොට දේශපාලන හික්ෂූන්ගේ දේශනාවලට ආසාවෙන් සවන් දුන් මට මේ නව සඟ පටලුර ගැන පැහැදීමක් හට ගන්නේ නැත . ඒ නම් හුදෙක් මගේ ඒජාප විරෝධය නිසා බව අවංකවම කියා සිටිමි.

දැන් තුන්වැනි වටයටත් මහ සඟ පිරිස් දේශපාලන අඩවිවක් අල්ලා පාර්ලිමේන්තුවේ අසුන් ගෙන සිටින යුගයක් එළැඹ ඇත . මා සකළවිධ දේශපාලන මුහුනුවර දරා සිටින හික්ෂූන් දෙස යොමු කරන්නේ උදාසීන බැල්මකි. ඒ බැල්මට ප්‍රබල ප්‍රශ්නාර්ථයක් ද ඇතුළත් වන්නේ ය.

මගේ ආකල්ප විපර්යාසය කෙරේ තදින්ම බලපෑවේ ඩී එන් සේනාරත්න නම් ලේඛකයා වසර කීපයකට උඩ දී ලියූ - බුදුන් නොවදාළ ධර්ම" නම් වූ අගනා ග්‍රන්ථයයි. බුදු දහමත් එහි ප්‍රායෝගික පක්ෂයත් විමර්ශනයට භාජන කරමින් සේනාරත්න ලියූ ඒ පොත තරම් මෑත භාගයේ වගකිවයුතු ගිහි පැවිදි දෙපක්ෂය විසින් ම නොතකා හරින ලද කිසිදු ප්‍රකාශනයක් නැතැයි සිතමි. මගේ ලංසුවට අනුව ඒ නොතකා හැරීම සංවිධානාත්මකව සිදු නොවුණත් නිහඬ පොදු සම්මුතියකින් සාකච්ඡාවට භාජන නොකර සිටීමක් විය. පොතේ තුන්වැනි මුද්‍රණයකුත් නිකුත් වූ බව දැනිමි. පොත මිලදී ගත්තෝ එය කියවා නිහඬ වූහ. කොහොමටත් එළියට පහළියට අවුත් ඝෝෂා කරන මහා බෞද්ධ ජනතාව යනු සීමිත පිරිසක් බව පැහැදිළි ය.

මෑත භාගයේ ජාතික ව්‍යසනයක් බවට පත්ව තිබුණු ත්‍රස්තවාදයේ ආරම්භයට තුඩු දුන් භාෂා සටනෙහි ලා පෙරමුණ ගත් හික්ෂූන් විසින් කරන ලද හානිය නොහොත් ගිහි ඇවිළීම ගැන සේනාරත්න ඉතා ඇඹුල් සහිතව විස්තර කර ඇත .

ඒවායේ ඇත්ත යට ගසා හොඳ පැත්ත පමණක් ඉස්මතු කිරීම බෞද්ධ ප්‍රබෝධයේ පෙරගමන්කරුවන්ගේ සුපුරුදු පිළිවෙත ය. වත්මනෙහි උත්සවාකාරයෙන් සමරණු ලබන සම්බුද්ධත්ව ජයන්ති වර්ෂය පවා මේ කියන ප්‍රදර්ශන ස්වරූපයෙන් තුරන් වූවක් නොවේ. ගිහි පැවිදි දෙපක්ෂයම කරන්නේ බුදු සිරිත හා බොදු සළකුණු ප්‍රදර්ශනය කරමින් තම තමන්ගේ බලය හා ජනප්‍රියතාව වර්ධනය කර ගැනීමට බැලීම ය.

ගංගොඩවිල සෝම හිමියන්ගේ හදිසි අභාවයෙන් පසු පැන නැගුණු සංවේග ධාරාව ඔස්සේ ද සිය බලය තහවුරු කර ගැනීමට බැලූ හික්ෂූන්වහන්සේ කීප දෙනෙක්ම අඳත් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අසුන් ගෙන සිටිති. ඔය පාර්ලිමේන්තු ආතුමණය ගැන සේනාරත්න ලියුවේ නැත . ලියුවා නම් එකත් එකට ඔය බුදුන් වදාළ මාර්ගය නොවේ යයි ඔහු කෙළින්ම ප්‍රකාශ කරනු නියත ය.

පාර්ලිමේන්තු ඔස්සේ නිවනට යාමක් ආර්ය අෂ්ටාංගික මාර්ගයට ඇතුළත් නොවන බව වතාවක් ඒජාප නායක රනිල් වික්‍රමසිංහ නම් වූ බෞද්ධ පඬිවරයා විසින් ම ප්‍රකාශ කරන ලද බවක් මට මතක් වෙයි. ඔහුගේ ගිල මුදාවා රහිතව පවා ඒ මතය වලංගු වන බව අවධාරණය කරමි.

-මා මේ කසාය වස්ත්‍රයෙන් ආවරණය කරනු මැතවි" යි ශ්‍රමණ ජීවිතයට පිවිසෙන්නට පෙරාතුව සිය ගුරු ගිමියන්ගෙන් ඉල්ලා සිටින දරුවා නොහොත් ආධුනිකයා ඒ සමගම තමා ඉදිරියේ තබා ගන්නා නිශ්චිත අරමුණක් ද ප්‍රකාශ කරන බව බොහෝ දෙනාට අමතකව ඇති පාට ය.

ඒ කියන කාර්යය ඉටු කරනුවස් පාර්ලිමේන්තුව වාගේ කෝලාහල සහිත මන්දිරයක් තබා වෙනත් ආකාරයක සරන බිමක් ගැන ඉඟියක්වත් නැත . හැම අතකින්ම සිතාගන්නට හෝ දකින්නට ඇත්තේ එහෙම එක එල්ලයක් - අරමුණක් - කරා යාමට දරුනු ලබන ප්‍රයත්නයකි.

එකී ප්‍රයත්නය වූ කලී එක්තරා විදියක දීර්ඝ සංග්‍රාමයක් ද වන්නේ ය. පුද්ගලයන් සංසාරයට බැඳ තබන කෙළෙස් මල සමග කරන ඒ නිරන්තර සංග්‍රාමය සාමාන්‍ය අවි ආයුද අතින්ගෙන කරන්නක් නොවේ. මනසින් කරන - මනස සකස් කරගෙන - මනස මනාව මෙහෙයවා කරන නිරන්තර අරගලයක් පමණි.

මෙහෙම බණක් වියත් මහ සඟරුවන මතක් කර දීමේ බලතල හෝ අයිතිවාසිකමක් මට නැත . මා කරන්නේ තුදෙක් මගේත් පාඨක ජනයාගේත් පහන් සංවේගය උදෙසා අමතකව ගිය මූලික කරුණක් දෙකක් ඉස්මතු කර පෙන්වීම පමණි. ඒක වුණත් කාටවත් රිදවන්නට හෝ අනෙකකු ඔසවා තබන්නට දරන වෑයමක්ද නොවේ.

ඒ සමගම අවංකවම අවධාරණය කළ යුතු යථාර්ථයක් ද මම දකිමි. එය නම් පුන පුනා කිව යුතුමයි. සම්බුද්ධත්ව ජයන්තිය ගමින් නැතහොත් වෙනත් ආකාරයක බෞද්ධ ප්‍රබෝධයක නාමයෙන් අද දවසේ ශ්‍රී ලංකාද්වීපය පුරා පවත්වනු ලබන බොහෝ ප්‍රදර්ශන ප්‍රදක්ෂිණා හා දක්ෂිණා මගින් අර ආධුනික සාමණේරයන් වහන්සේ සිය අරමුණ වශයෙන් ප්‍රකාශ කරන අවසාන ඉලක්කයට කිට්ටු කිරීම අපහසු බව ය.

බුදු හාමුදුරුවන්ගෙන් පමණක් නොව වෙනත් මහරහතුන්ගෙන් බණ ඇසූ සැදැහවතුන් දහස් ගණනින් සමහර විට සිය දහස් ගණනින් නිවන් දුටු බව බණ පොතෙහි කියා ඇත . ඔය කියන තරම් ජනගහනයක් ලෝකයේ ඒ කාලයේ හිටියා ද යන සැකයක් විටක හට ගන්නේ ය. ඒ කොහොම වුණත් බුදු බණ ඇසීම නිසා නිවන් දුටු ආකාරයට අද දවසේ කරන ප්‍රදර්ශන ඔස්සේ මිනිසුන් නිවනට පිටත් කර යැවීම බොරුය. අද කරන ප්‍රදර්ශනය ජන්ද ගණන් කිරීමට නොදෙවෙනි ක්‍රීඩාවකි. එය නිවන් ගමනට සපුරා වෙනස් ලෞකික ව්‍යායාමයක් පමණි.

රනිල් වික්‍රමසිංහ මහතාට මොකක් දෝ ජාතික පෙරමුණකට අයත් මහා සංඝයා ආණ්ඩු මේච්චල් කිරීම ප්‍රශ්නයක් නොවන්නේ ඒ නිසා ය. ඔවුන් නිරතව සිටි දේශපාලන ක්‍රීඩාව වුනත් අනුදැන වදාළ ප්‍රයත්නයක් හෝ පමණක් නොවන හින්දා ය.



Kelani Nadee Yatra

The longest and most successful environmental educational program ever run along a river in Sri Lanka

Kanchana Weerakoon recently led an amazing 12 day journey with 21 Sri Lankan youth down the Kelani River. Kanchana is founding president of Sri Lankan based environmental organisation Eco Friendly Volunteers (ECO-V) and co-founder for Journeys for Climate Justice (JCJ) which is based in Australia.
Come and hear Kanchana when she is visiting Australia. She will talk about her experience on this innovative project which targeted climate change mitigation and adaptation in Sri Lanka.

Kanchana will be sharing her experiences with the Melbourne community at a presentation, with photos, stories from youths, and a documentary film.
This is not the end of the journey for climate change challenges that Sri Lankans are facing. The Kelani Nadee Yatra team are initiating many new projects to do their duties for Mother Sri Lanka.

Date: Saturday 3rd December 2011 at 4:00 p.m.

Location: Mount Street Neighbourhood House Inc.
6, Mount Street
Glenn Waverley, Vic 3150
Melway Reference: Page 71 D2

For further details please contact Manjith on 0411702064